# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 172 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 30/01/2024<br>පැය 0555 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - හක්මණ පොලිස් ස්ථානය.**

2024.01.22 වන දින බෙලිඅත්ත පොලිස් වසමේ දක්ෂිණ අධිවේගී මාර්ග පිවිසුම ආසන්නයේදී පුද්ගලයින් 05 දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් සිදුකරනු ලබන විමර්ශනයේදී එම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකාරියන් දෙදෙනෙකු 2024.01.29 වන දින උදෑසන කාලයේදී හක්මණ පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් රත්ගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරියන් වයස අවුරුදු 23 හා 33 ක් වන බූස්ස ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

අපරාධය සිදුකිරීමට යොදාගත් ගිනි අවි දෙක අපරාධය සිදුකිරිමෙන් පසු මෙම එක් සැකකාරියකට අයත් යතුරු පැදියකින් කරාපිටිය ප්‍රදේශයේ සිට බූස්ස ප්‍රදේශයට ප්‍රවාහනය කර ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී කරුණු අනාවරණය වී ඇත.

හක්මණ පොලිස් ස්ථානය මගින් වැඩිදුරටත් විමර්ශන සිදුකරනු ලබයි.

**02. සැකකටයුතු මරණයක් - අඟුරුවාතොට පොලිස් වසම.**

2024.01.29 වන දින උදෑසන කාලයේ අඟුරුවාතොට පොලිස් වසමේ දොඹගොඩ යුධ හමුදා කඳවුර තුල පිහිටි කුඩා වැවක මෘත ශරීරයක් ඇති බවට එම කඳවුරේ නිලධාරියෙකු විසින් අඟුරුවාතොට පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මියගිය පුද්ගලයා දොඹගොඩ යුධ හමුදා කඳවුරේ සේවය කරන යුද හමුදා සෙබලෙකු බවට අනාවරණය වී ඇත. මෙම සෙබළා 2024.01.28 වන දින උදෑසන සිට කඳවුරේ නොසිටි බවත් ඒ සම්බන්ධයෙන් සොයා බැලීම් සිදු කර ඇති අතර 2024.01.29 වන දින අළුයම එම කඳවුරේ සේවය කරන සෙබලෙකු විසින් යුද හමුදා කඳවුර තුල පිහිටි කුඩා වැවක මෘත ශරීරයක් තිබෙනු දැක ඇති බවටත් පොලිසිය විසින් සිදු කල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

**මරණකරු වයස අවුරුදු 23ක්වූ තෙලුල්ල ජනපදය, ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදුකර හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර 2024.01.30 වන අද දින පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කිරීමට නියමිතව ඇත. අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. අන්තර්ජාලයේ මුදල් ආයෝජනය කරවන බවට පවසා මුදල් වංචාකල සැකකරුවකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

අන්තර්ජාලයේ මුදල් ආයෝජනය කරදෙන බව පවසා රුපියල් 1,567,000 ක මුදලක් වංචා සහගත ලෙස බැංකු ගිණුමකට තැන්පත් කරවාගෙන සාපරාධී විශ්වාසය කඩකිරීමක් සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය වෙත ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් සිදුකර එම කොට්ඨාසයේ නිලධාරින් විසින් 2024.01.29 වන දින සවස් කාලයේදී අදාල වංචාව සිදුකළ පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන හිරිපිටිය, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.01.29 වන දින සවස් කාලයේ මන්නාරම පොලිස් වසමේ සවුත්බාර් ප්‍රදේශයේ දී මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **මත්කරල් 31390ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක් වන එමිල් නගර්, මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – පමුණුගම පොලිස් ස්ථානය.**

2024.01.29 වන දින රාත්‍රී කාලයේ පමුණුගම පොලිස් වසමේ පුබුදුගම මුතුරාජවෙල වගුරුබිම් ප්‍රදේශයේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 33.5 (බෝතල් 45) ගෝඩා ලීටර් 1890 (බැරල් 10) ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන පුබුදුගම, උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු හා සැකකරුවෙකු නොමැති මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.**

2024.01.29 වන දින සවස් කාලයේ දඹගල්ල පොලිස් වසමේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් නීල බැද්ද කදු රක්ෂිත ප්‍රදේශයේ **සෝදිසි මෙහෙයුමක් සිදුකර රක්ෂිත ප්‍රදේශයේ සඟවා තිබූ** මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් අත්අඩංගුවට ගෙන ඇති අතර එම පොලිස් වසමේ නාමල්ඔය ප්‍රදේශයේ සිදුකල වැටලීමකදී **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන දඹගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹගල්ල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.